# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 නොවැම්බර් මස 20 වන දින

## II වන කොටස

## අතිරේකය

(2020.11.23 දින නිකුත් කරන ලදී.)

# ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්.එම්. මරික්කාර් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 23.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය
# (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

"ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2020 අංක දරන ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ශ්‍රී ලංකා භෞත චිකිත්සක සංගමය සංස්ථාගත කිරීම.*

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු ව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමයේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවන ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය.

(2) මෙම සංස්ථාව ශ්‍රී ලංකාව තුළ සේවය කරන භෞත චිකිත්සවේදීන්ට ඇති එකම වෘත්තීය, උසස් අධ්‍යයන සහ ප්‍රධාන පාලක ආයතනය ද වේ.

(3) සංස්ථාව 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) භෞතචිකිත්සවේදය හා සම්බන්ධිත විද්‍යාවන් ප්‍රවර්ධනය කිරීම සහ සංගමයේ අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය සමග ද, විශේෂයෙන් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යතුමා සමග මනා සබඳතාවක් පවත්වා ගනිමින් භෞතචිකිත්සක වෘත්තියේ ගෞරවය සහ බැඳියාවන් පවත්වාගෙන යාම;

(ආ) භෞතචිකිත්සක වෘත්තිය ශ්‍රී ලංකාව තුළ සියලු ආකාර හා අවශ්‍යතාව වෙනුවෙන් ප්‍රවර්ධනය කිරීම;

(ඇ) එහි සාමාජිකයන්ට හමුවීමට, සාකච්ඡා කිරීමට හා පොදු ගැටලු විසඳා ගැනීමට නාභිගත කේන්ද්‍රයක් ඇති කිරීම;

(ඈ) සංගමය විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි, භෞතචිකිත්සවේදය හා සම්බන්ධිත විද්‍යාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංගමයේ අරමුදලින් මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම;

(ඉ) වයෝවෘද්ධ හෝ අවශ්‍යතා ඇති භෞතචිකිත්සා වෘත්තියේ සාමාජිකයන්ට සහන සැලසීම පිණිස භෞතචිකිත්සක යහසාධක අරමුදලක් පිහිටුවීම;

(ඊ) සංගමයේ අවශ්‍යතා වර්ධනය කර ගැනීම සඳහා විශේෂඥ උපදෙස් හා උපකාර ලබා ගැනීමේ අරමුණ පෙරදැරිව හා සංගමයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අන්තර්ජාතික භෞතචිකිත්සක සංවිධාන සමග සබඳතා ඇති කර ගැනීම, හා තහවුරු කර ගැනීම ආරක්ෂා කර ගැනීම;

(උ) දේශීයව හා අන්තර්ජාතික වශයෙන් භෞත චිකිත්සාවේදයේ නව වර්ධනයන් හා වැඩි දියුණු කිරීම් පිළිබඳව භෞතචිකිත්සක වෘත්තියේ සාමාජිකයන් දැනුවත් කිරීම ;

(ඌ) භෞතචිකිත්සක ක්ෂේත්‍රයේ තමන්ගේ දැනුම හා නිපුණත්වය හුවමාරු කර ගැනීමට, බෙදාගැනීමට සාමාජිකයන්ට සංසදයක් ඇති කිරීම;

(එ) භෞත චිකිත්සක ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය සාක්ෂාත් කරගැනීම උදෙසා සාමාජිකයන්ගේ වෘත්තීය පැවැත්මේ ගුණාත්මක ප්‍රමිතිය වර්ධනය කිරීම

සහ තවදුරටත්,

(ඒ) සංගමයේ ලියාපදිංචි වෘත්තිකයන් සඳහා වෘත්තීමය ආචාරධර්ම සංග්‍රහයක් ඇති කිරීම;

(ඔ) සංගමයේ ප්‍රකාශනයක් වශයෙන් කාලීනව වාර සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම;

(ඕ) සංගමයේ සාමාජිකයන් සමග වරින්වර හමුවීම් පැවැත්වීම ;

(ක) ශාලා, පුස්තකාල, දේශන ශාලා හෝ සංගමයේ වෙනත් කාර්යයන් සඳහා භාවිත කිරීම පිණිස අවශ්‍ය ඉඩම් හෝ වෙනත් පරිශ්‍රයන් මිලදී ගැනීම, බද්දට ගැනීම, කුලියට ගැනීම, දරා සිටීම හා නිදහස් කිරීම;

(ග) සංගමයේ සාමාජිකයන් සඳහා උපදෙස් හා පුහුණුවීම් ලබාදීම ;

(ච) භෞතචිකිත්සක ක්ෂේත්‍රයේ ඇතිවන ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම;

(ජ) විශ්වවිද්‍යාල, උසස් වෘත්තීය ප්‍රමිතියකින් යුත් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් වෙනත් අධ්‍යාපන ආයතනවලට භෞතචිකිත්සක විෂයය සම්බන්ධයෙන් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍යාධාර සැපයීම ;

(ට) සංගමයේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා නිපුණතාවයක් ඇති පුද්ගලයින් සේවයේ යෙදවීමට පුහුණුවීම් සහ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථාන සහ හෝ වැඩසටහන් සංවිධානය, පැවැත්වීම හ පවත්වාගෙන යාම;

(ඩ) සංගමයේ කටයුතු ක්ෂේත්‍රයේ දේශීය සහ විදේශීය උපදේශකයින්ගේ, විශේෂඥයින්ගේ, ස්වේච්ඡා සේවකයින්ගේ සේවය පාරිශ්‍රමික ගෙවීමේ හෝ නොගෙවීමේ පදනම මත ලබා ගැනීම;

(ණ) සංගමයේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා සංගමය විසින් අනුමත කරනු ලබන අය සංගමයේ පිරිවැයෙන් හා වියදමින් ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පුහුණු කිරීම හා පුහුණුව ලැබීමට සැලැස්වීම;

(ත) සංගමයේ කිසියම් අරමුණක් ප්‍රවර්ධනය කිරීම සඳහා කිසියම් විශේෂ භාරයකට හෝ කොන්දේසිවලට යටත් ව හෝ නොමැතිව ස්ථිර හෝ චංචල දේපළ ලෙසින් ලබාදෙන දයකත්ව, ත්‍යාග, ප්‍රදන, පවරාදීම්, මුදල්මය හෝ ද්‍රව්‍යමය පරිත්‍යාග වශයෙන් සංගමයේ කටයුතුවලට අවශ්‍ය අරමුදල් පිළිගැනීම හා රැස්කිරීම;

(ද) සංගමයේ කටයුතු සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි වාහන, යන්ත්‍රෝපකරණ, යන්ත්‍රසූත්‍ර හෝ වෙනත් යම් විෂයයක් හෝ දෙයක් ලබාගැනීම සඳහා කල්බදු ක්‍රමය යටතේ බැංකු හෝ වෙනත් ණයදෙන ආයතන සමග ගිවිසුම්වලට එළඹීම;

(න) පූර්ණ හෝ කොටස් වශයෙන් සංගමයේ දේපළ හා වත්කම් මිලදී ගැනීම, විකිණීම, උකස් කිරීම, බදු දීම, අන්සතු කිරීම හෝ ඒ සම්බන්ධව අන්‍යාකාරයකින් කටයුතු කිරීම;

(ප) සංගමයේ අරමුණු එකක් හෝ සියල්ලම ඉටු කරගැනීම හෝ බැඳියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලයකු හෝ පොදු සමාගමක් හෝ වෙනත් ආකාරයක් හරහා විදේශීය සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඔ) කලින් කලට තීරණය කරනු ලබන පරිදි, සංගමයේ කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවන සංගමයේ මුදල්, එහි අරමුණු වෙනුවෙන් ආයෝජනවල හෝ සුරැකුම්පත් වල ආයෝජන කිරීම හෝ අන්‍යාකාරයකින් යෙදවීම.

(2) 1 වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙන යම් හේතුවක් මත පදනම් කරගත් යම් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාව වග බලාගත යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්යය සමග සංස්ථාවේ කාර්යය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලැබූ සංගමයේ මණ්ඩලය, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම කමිටුව පත් කරනු ලබන හෝ තෝරා පත්කරනු ලබන දින තෙක් සංස්ථාවේ මණ්ඩලය වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමු මණ්ඩලය පත් කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසක සහ උපදේශක ඇතුළුව මණ්ඩලයේ ධුර දරන සෑම ධුර දරන්නකු ම වර්ෂ තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගත යුතු අතර, එකී වර්ෂ තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, නැවත පත්කිරීම හෝ නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය ;

(ආ) යම් ධුර දරන නිලධාරියකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී මණ්ඩලය විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩු පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු හෝ පත්කර ගත යුතු ය ; සහ

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කරගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

### සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීම, කුලියට ගැනීම,ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැලකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව අරමුදල් රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටපත් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත්

කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, ඉඩකඩම් හෝ පෞද්ගලික දේපළකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාරගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ පාලනය කිරීමට;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම, හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදුකිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ සෑදීම නීත්‍යනුකූල විය යුතු ය.:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන්, තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධාරින්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ කොන්දේසි සහ නියමයන්;

(ඇ) මණ්ඩලයේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සහ මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම, සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය.

**8.** සාමාජිකයන්ගේ නම් ලිපිනයන් සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් සාමාජිකයන්ගේ ලේඛණයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) සංස්ථාවේ සාමාජිකයන්ගේ නාමලේඛනය මණ්ඩලයේ ලේකම් වෙත තබාගත යුතු අතර, අවශ්‍ය අවස්ථාවක ඕනෑම සාමාජිකයකු විසින් පරීක්ෂා කර බැලිය හැකි ය.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, වශයෙන් ලැබෙන සියලුම මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාව වෙනුවෙන් බැංකු ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට සහ විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු පත්‍ර හෝ වෙනත් පැවරිය හැකි හෝ ගනුදෙනු කළ හැකි නීත්‍යානුකූල ලේඛන හෝ සුරැකුම්පත්, පිළිගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට ලේකම්, භාණ්ඩාගාරික සහ මණ්ඩලයේ තවත් සාමාජිකයකුට බලය තිබිය යුතු ය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම සහ වත්කම් හා බැරකම් හා සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) මණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳව වාර්තාවක් සෑම මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනයෙන් කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ එම වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ සයමාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන ලද සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමය ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්. ප්‍රදනයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය

ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.

**14.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**15.** (1) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකුගේ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිභාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**18.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.